# සාරාංශය

පශ්චාත් නව යොවුන්වියේ ළමයින්ගේ මානසික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පාසල් සංස්කෘතියෙන් ලැබෙන දායකත්වය පිළිබඳ විමර්ශනයක් කිරීම මින් අපේක්ෂිතයි.

යෞවනයා තුළ ස්වාභාවිකව තමාගේ වයසත් සමඟ සිදුවන කායික වර්ධනය මනා සංවර්ධනය ලක්ෂණ කරා යොමුවීමට නම් තමා අවට පරිසරය පෝෂිත විය යුතුය. එනම් තමාට සැපයෙන අවස්ථා හා ලබන අත්දැකීම් මත යෞවනයාගේ සංවර්ධනය තීරණය වේ. එනම් යෞවන සංවර්ධනය කෙරේ බලපාන ප්‍රබල සාධකයක් ලෙස ක්‍රියාකරන පාසල් පරිසරය යෞවනයා සිය යෞවන අවධිය වැඩි කාලයක් ගත කරන ස්ථානය වේ. පාසල් සංස්කෘතිය යෞවනයාගේ මානසික අවශ්‍යතා තෘප්ත වන අයුරින් ක්‍රියාත්මක නොවන්නේ නම් ඔහුගේ සමස්ත පෞරුෂය වර්ධනයට බාධකයකි. එහෙයින් යෞවනයාගේ මානසික අවශ්‍යතා හඳුනාගෙන ඒවා පාසල් සංස්කෘතිය තුළින් මනාසේ ඉටු කිරීම සඳහා පවතින වාසිදායක සාධක වැඩිදියුණු කිරීමටත්, අවාසිදායක සාධක අවම කර ගැනීමටත් පහත අරමුණු ඔස්සේ මෙම පර්යේෂණය මෙහෙයවන ලදි.

1. පශ්චාත් නව යොවුන් විය හා පාසල් සංස්කෘතිය හඳුනාගැනීම.
2. අවශ්‍යතා සම්බන්ධ විවිධ න්‍යායයන් තුළින් මානසික අවශ්‍යතා හඳුනාගැනීම.
3. මානසික අවශ්‍යතා ඉටුකරගැනීමට පාසල් සංස්කෘතියේ දායකත්වය කොතරම් දුරට ඉටුවන්නේ දැයි සොයා බැලීම.
4. මානසික අවශ්‍යතා ඉටුකර ගැනීමට පවතින බාධා හා ඒ සඳහා ක්‍රියාත්මක කළ යුතු යෝජනා ඉදිරිපත් කිරීම.

උක්ත අරමුණු ඉටුකර ගැනීම සඳහා කොළඹ හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ජාතික, 1 AB, 1C පාසල් වර්ගයන්හි සිසු-සිසුවියන් 200කට ලබාදෙන ලද ප්‍රශ්නාවලියක් තුළින් පර්යේෂණය මෙහෙවන ලදි. තව ද පාසල් සංස්කෘතියේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා පාසල සම්බන්ධ ලිඛිත මූලාශ්‍ර පරිහරණය කළ අතර, විදුහල්පති, ගුරු මණ්ඩලය හා ආදි ශිෂ්‍යයන් සමඟ අවිධිමත් සම්මුඛ සාකච්ඡාවන් යොමු කරමින් සිසුන්ගෙන් ලබා ගන්නා ලද දත්ත තහවුරු කර ගන්නා ලදි. ලබාගත් දත්ත ප්‍රතිශත හා වගු ආශ්‍රයෙන් විග්‍රහ කරන ලදි.

ආරක්ෂාව සම්බන්ධ මානසික අවශ්‍යතාව පාසල තුළින් ඉටුවීමේ දී විදුහල්පති ඇතුළු ගුරු මණ්ඩලය, ශිෂ්‍ය නායක භූමිකා ප්‍රමාණවත් මට්ටමකින් නොපවතින බව නිගමනය කළ හැකි විය. සිසුන් පාසලේ දී මුහුණ දෙන ආපදා තත්ත්වයන්හි දී ගුරු භූමිකාව වගකීම්

හැකි විය. සිසුන් පාසලේ දී මුහුණ දෙන ආපදා තත්ත්වයන්හි දී ගුරු භූමිකාව වගකීම් සහගතව ක්‍රියා කරන බව ද, කාර්ය මණ්ඩලය තුළින් සිසුන්ගේ ආරක්ෂාව සඳහා දරන වගකීම ප්‍රමාණවත් නොවන බව ද නිගමනය වේ.

ග්‍රාමීය හා නාගරික සිසුන්ට සමවයස් මිතුරන්ගෙන් ආදරය සම්බන්ධ මානසික අවශ්‍යතාවයට ප්‍රමාණවත් දායකත්වයක් ලැබෙන බව ද, ශිෂ්‍ය නායකයන් සමග ග්‍රාමීය සිසුන්ට වඩා නාගරික සිසුන් සුහදත්වයෙන් ක්‍රියා කරන බව ද, ගුරු සිසු සුහද සබඳතාව ප්‍රමාණවත් මට්ටමකින් නොලැබෙන බව ද, යොවුන් වියේ ප්‍රේම සම්බන්ධතාවලට පාසල් සංස්කෘතියෙන් තහංචි දමා ඇති බව ද, නිගමනය විය. ළමුන්ගේ පිළිගැනීමේ මානසික අවශ්‍යතාව ග්‍රාමීය අංශය හා සසඳන කළ නාගරික පාසල් තුළින් යම් මට්ටමක ඉහළ ප්‍රවනතාවයක් දක්නට ලැබුණු බව අනාවරණය විය. විෂය සමගාමී හා විෂය බාහිර කටයුතු සම්බන්ධව ග්‍රාමීය පාසල්වල නව යෞවනයාට නාගරික පාසල් හා සසඳා බලන කළ වැඩි නිදහසක් ලැබෙන බවත්, විෂය බද්ධ කටයුතුවල දී පාර්ශව දෙකෙහිම යෞවනයාගේ නිදහස සීමා වී ඇති බවත් නිගමනය වී ඇත. බුද්ධිමත් දර්ශනයක් ඇති කර ගැනීමට යෞවනයා වැඩි උනන්දුවක් දක්වන නමුත් නාගරික පාසල් තුළ තරම් ඒ සඳහා ප්‍රමාණවත් සම්පත් දායකත්වයක් ග්‍රාමීය පාසල් තුළ දක්නට නොමැති බවද නිගමනය කළ හැක. ලිංගික තොරතුරු දැන ගැනීමේ මානසික අවශ්‍යතාවය ද පාසල් සංස්කෘතීන් තුළින් විධිමත් විද්‍යාත්මක සන්නිවේදන ක්‍රමයක් ප්‍රමාණවත් අයුරින් භාවිත නොවෙන බව ද නිගමනය කළ හැකි විය.

පශ්චාත් යෞවනයන්ගේ මානසික අවශ්‍යතා, පාසල් සංස්කෘතිය තුළින් තෘප්ත කිරීම සඳහා විදුහල්පති ඇතුළු ගුරු භූමිකා ඵලදායක ගුණාත්මක අයුරින් ශක්තිමත් කිරීම, මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් වඩාත් ප්‍රායෝගික මට්ටමින් ක්‍රියාත්මක කිරීම, ශිෂ්‍ය නායකයන් හා සිසුන්ට වඩාත් යහපත් ධනාත්මක ආකල්ප ඇති කිරීම, ශිෂ්‍ය නායක භූමිකා ඵලදායක ගුණාත්මක වර්ධනය සඳහා ප්‍රායෝගික වැඩ මුළු පැවැත්වීම, අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව වැඩි කිරීම, පාසල තුළ ආපදා කළමනාකරණය ක්‍රියාත්මක කිරීම, ගුරු සිසු සුහදත්වය වර්ධනය කෙරෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාසල තුළ සිසු නායකත්වය හා ජයග්‍රහණ තේරීම් සඳහා විධිමත් කමිටු පිහිටුවීම, විභාග ඉලක්ක කරගත් අධ්‍යාපන ක්‍රමය වෙනුවට බහුවිධ බුද්ධිය වැඩිදියුණු කෙරෙන අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම, බුද්ධිමත් දර්ශනයක් හා ලිංගික තොරතුරු දැනගැනීමට විද්‍යාත්මක සන්නිවේදන ක්‍රමයක් සකස් කිරීම, විද්‍යාත්මක පොත්පත් පරිශීලනය සඳහා පුස්තකාල පහසුකම් හා අන්තර්ජාල පහසුකම් සැපයීම ආදිය පශ්චාත් නව යෞවනයන්ගේ මානසික අවශ්‍යතා තෘප්ත කිරීම සඳහා පාසල් සංස්කෘතිය තුළින් ඉටු කළ හැකි යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකිය.